بسم الله الرحمن الرحيم

මෙවැනි කුඩා ලිපියකින් ඔබ ඇමතීමට අවස්ථාවක් ලැබීම ගැන අප සිත් සන්තානය තුල දෝරගලන සතුට අප්‍රමාණය. එසේම අසිරිමත් ලෙස සිත් තුල දෝරගලන සෙනෙහසද ඔබට කියා පාන්නෙමු. තවද ඔබ ලද මේ කුඩා ලිපිය සන්සුන්ව කියවා එහි ලියවුනු කරුණු ගැන සිතා බලනු ඇතැයිද බලාපොරොත්තු වෙමු. මේ හසුන දෙන ඔවදන එක්සිතින් පිළිගෙන කීකරුවී ඒවා සතුටින් පිළිගනු ඇතැයිද බලාපොරොත්තුවෙමු.

මෙවැන්නකින් ඔබ අමතන්නට ප්‍රධානතම හේතුව වූයේ ඔබ සත්‍ය ආගම පිළිගෙන අසහාය ඉස්ලාමීය සහෝදරයෙකු ලෙස වී සතුටෙන් සහ යහපත් දිවි මගක් ගෙවිය යුතුය යන එකම අරමුණ වන අතර අප වෙත ඔබගේ සන්තෘෂ්ටිමත් ළඟාවීමද අරභයාය.

එහෙයින් මෙම හසුන කියවා එහි අඩංගු කරුණු පසක් කරගැනීමට ඔබගේ රන්වන් කාලයෙන් ස්වල්පයක් වෙන්කරනු ඇතැයි බලාපොරොත්තුවෙමු. අප ඉමහත් සොම්නසින් බලාපොරොත්තු වන අයුරු ඔබ උදාර ලෙස ක්‍රියා කරනු ඇතැයි අප අපගේ අතිමහත් පැසසුමද ඔබට හිමි කරමු.

**අප මෙම හසුනෙන් ඔබට කියාපෑමට සූදානම් වන්නේ,**

මිනිසා මේ මිහිපිට කුමක් උදෙසා නිර්මාණය වීද, මිහිපිට ඔහුගේ ක්‍රියා කලාපයන් කෙසේ විය යුතුද

යන්න පැහැසරව ඔබ චින්තන පද්ධතියට එත්තු ගැන් වීමට මේ සුලු හසුන මගින් අදහස් කරන්නෙමු. සැම මිනිසාම හුදෙක් කල්පනා කර බැලිය යුතු මේ අතිමහත් කාර්යභාර්යේ යථාර්ථය ඔබද වටහා ගෙන ඔබගේ අදහස් අපටද දැනුම් දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

හුදෙක් මිනිසාගේ මිහිපිට පැමිණීම කිසිදු හරයක් නොවන්නේ නම්, අන් කිසිදු කරුණක් ගැන නොදැන පසුවන්නේ නම් ඔහුට සමාවිය හැක. නමුදු යථාර්ථ යේ සත්‍යතාවය ගැන කිසිදු තැකීමකින් තොරව තම සිත්සේ නොසැලැකිලිවන්තව පසුවන්නේ නම් අල්ප ශ්‍රැත සාමාණ්‍ය කෙනෙකු පවා එය අනුමත නොකරයි. යමෙකු එසේ ක්‍රියාකරන්නේ නම් විශාල අනර්ථයන් ඇතිවන අතර ඔහුට ලැබිය හැකි සෞභාග්‍යයන්ද දෙලොවෙහිම අහිමි වන්නට පුළුවණ.

**සියළු ක්‍රියාවන් හට ක්‍රියාකලාපයන් වේ.**

මුලු මහත් විශ්වය ගැනද එහි නිර්මාණයවී ඇති කුඩා සහ සුවිශාල නිර්මාණයන් ගැනද මදක් සිතා බැලීම මනාය. ව්‍යාප්තව පවතින මිහිතලයද, එහි කඳු, හෙල්, ගංගා, සත්වයන්, වෘකෂලතාදීන්, අප හිසට ඉහළින් පිහිටි නිල්වන් අහස් තලය, දීප්තිමත් ඉර, සඳ සහ අසංඛ්‍යාත තාරකාවන් වැනි සුවහසක් නිමැවුම් අතිමහත් අන්දමින් රීත්‍යානුකුලව විශ්ම ජනකව නිර්මාණය කළේ කවරෙක්දැයි ඔබ දන්නවාද?

තවද මේවා සියල්ල වැදගැම්මකට නැතිව අනිවාර්ථේ නිර්මාණය කර ඇතැයි ඔබ සිතනවාද? නොවන්නට නිර්මාතෘවරයා විසින් නිර්මාණය කරන ලද සියලු දෑ හට අරමුණක් සහිත ක්‍රියා පද්ධතියක් ඇතැයි ඔබ සිතනවාද? නිදසුන් වශයෙන් මිනිසා විසින් නිර්මාණය කරන ලද යානවාහන, පෑන, යන්තෝපකරණ සහ යතුර වැනි අසංඛ්‍යාත නිර්මාණයන් මිනිසා අනිවාර්ථේ නිම නොකළ බව ඔබ නොදන්නා කරුණක් නොව.

මිනිසා නිරපේක්ෂාවෙන් අනිවාර්ථේ ඒවා නිර්මාණය කළේ නම් ඔහු මුග්ධයෙකු හෝ පිස්සෙකු ලෙස හංවඩු ගසනු පසක්ය. නමුදු මිනිසාගේ නිරාකුල් සිත් සන්තානය සහ පැහැසර චින්තනයන් මිනිසා එසේ ක්‍රියා කිරීමෙන් වළකන්නේය. එහෙයින් එවායේ යමක් එහි අරමුණ අරභයා සෘජුව ක්‍රියා නොවී නම් හෙතෙම එය විකුණා දැමීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට හෝ ඉවත් කිරීමට හෝ උත්සුක වන්නේය. එසේ කිරීමට ඔහු පෙළඹෙන්නේ ඒවා නිර්මාණයේ අරමුණ වෙනුවෙන් යථාර්ථයානුකූලව ක්‍රියා නොකරන නිසාය.

## මිනිසාගේ යථාර්ථ ක්‍රියාවලිය

මිනිසා විසින් නිර්මාණය කරන ලද නිර්මාණයන් හට පවා මෙසේ අරමුණක්වූ ක්‍රියාවලියක් වේනම් මෙලොව නිර්මාණයවූ මහඟු නිර්මාණය වන මිනිස් වර්ගයාගේ ක්‍රියාවලිය කෙසේ විය යුතුදැයි අප තුලින්ම ප්‍රශ්න කළ යුතුව ඇත. සර්ව බල දෙවියන්

වන අල්ලාහ් මිනිසාට ඥානය, ශ්‍රවණය, බැල්ම සහ විමසුම වැනි අනුග්‍රහයන් ලබාදී හොඳ නරක ගැන පහදා ස්වෛරී ස්වාදීනත්වයෙන් ක්‍රියාකිරීමේ කෞශල්‍යද පිරිනමා අති උදාර අන්දමින් මිහිපිට නිර්මාණය කළේය.

මෙසේ සර්ව බල අල්ලාහ් දෙවියන් විසින් මිනිසා අති උදාර අන්දමින් නිර්මාණය කළේ කාබී කල් ගෙවීමටද? නොවන්නට කෙලිලොලෙහි යෙදී ප්‍රීති වී ජීවිතය කිසිදු හරයකින් තොරව අනිවාර්යේ ගෙවා දැමීමටද? නොඑසේ නම් සුවහසක් කම්සැප සුවයෙහි එරී අන්තෝමතික ලෙස ලෞකික සුකුමාර ජීවිතයක් වෙනුවෙන් ක්‍රියා කිරීමටද? එසේත් නොවන්නට දිවා රෑ නොතකා විසිරී තිබෙණ ලෞකික සේසත් එක්රැස් කරගන්නද? එසේත් නොවන්නට පත්විය හැකි සුවහසක් කරදරයන් ගොනුකර සිහිකරමින් දුක්දොම්නසෙහි නිරත වන්නද? එසේත් නොවන්නට මිනිසා කුමක් පිණිස නිර්මාණයවීද? මිනිස් නිර්මාණයේ ප්‍රධාන ඉලක්කය කුමක්ද? මෙවැනි සුවහසක් ප්‍රශ්ණ මාලාවකි. ඒ දහසකුත් එකක් ප්‍රශ්ණයන් හට පිළිතුරු සෙවිම පිණිස ඔබද අප සමග එක්වනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු. එසේ නම් ඒ ප්‍රශ්ණයන් හට පරිශිෂ්ට වාස්තවික පිළිතුරු කෙසේ විය යුතුද? ඒපිළිතුරු සඳහාවූ ප්‍රධාන කරුණක් වන්නේ සත්‍ය දෙවියාය. එසේ නම් සත්‍ය දෙවියා කවරෙක්ද? එයට සුදුසු පිළිතුර වක්තෘවරුන්ද, අල්ලාහ් විසින් හෙළිදරව් කරන ලද දිව්‍ය වදන්ද මෙසේ විස්තර කරයි:

අල්ලාහ් තආලා මිනිසා නිර්මාණය කළේ මිනිසා, ගස්, ගල්, ඉර, ගින්න සහ අනෙකුත් විද්‍යාමාන දේවල් දෙවියෙකු ලෙස පිළිගෙන ආදේශ කර වන්දනාමාන කිරීමෙන් වැළකී අල්ලාහ් පමණක් වැඳ ඒකත්වයට පත්කරනු පිණිසය.

**සත්‍ය දෙවියන් වහන්සේ කවරෙක්ද?**

අති උසස් අන්දමින් නිර්මාණය කර උත්කෘෂ්ඨ ඥානයද ලබාදී ගෞරව කළ පසුද අල්පශ්‍රැතව මතු සඳහන් අන්දමින් විශ්වාස කරන මිනිසා ගැන ඔබ විශ්මයට පත් නොවූයේ මක් නිසාද?

- දෙවියා මිහිකතේ සාමාණ්‍යය මිනිසා තුල අරක් ගත හැකිය. එවිට මිනිසා දෙවියෙකු ලෙස හෝ දේව පුත්‍රයෙකු ලෙස හෝ උසස් පරිවර්ථනයකට පත්වී, මිනිස් සංහතියේ සියලු පාපයන් උදෙසා කැපවී ඒවා තමා මත පටවාගෙන ඒ වෙනුවෙන් දඬුවම් විඳිය හැකිය යනුවෙන් පිළිගැනීම.
- නොවන්නට මිහිකතට දෙවියෙක්, හිරුට දෙවියෙක්, සඳවතියට දෙවියෙක්, සේදවලාවන් හට දෙවියෙක්, කඳුහෙල් හට දෙවියෙක් සහ සකල නිර්මාණයන් හට දෙවියන් යනුවෙන් විද්‍යාමානවූ අදංඨ්‍යාත දේවල් හට දෙවියන් ඇති බව බහුදේව වාදය පිළිගැනීම.
- නොවන්නට අතියුත්තම නිර්මාතෘවරයා වන දෙවි යන් වහන්සේ හා තවත් දෙවිවරුන් දෙන්නෙකු ආරූඪ කරගෙන ත්‍රිත්ව දෙවත්වය පිළිගැනීම.

- නොවන්නට මලායින් පසු, මිනිසා සසර වසන කළ, කළ පුණ්‍ය කර්මයන් හේතුවෙන් තවත් ස්වරූපයක් ලබමින් නැවත පුනර්ජීවයක් ලබා ජීවිතයක් පටන් ගන්නා බව පිළිගැනීම.
- නොවන්නට මිනිසාගේ වෘතිය, ජාතිය සහ දේහ ලක්ෂණයන් අනුව වර්ග කිරීම පිළිගැනීම. නිදසු නක් වශයෙන්: දෙවියන් කොටසක් තම මුහුණෙන් උත්කෘෂ්ඨ අන්දමින් ප්‍රභූත්වයට, නායකත්වයට සුදුසු ලෙස නිර්මාණය කළ බවත්, තවත් සමහරෙකු දෑතෙන් නිර්මාණය කළ බවත්, තවත් සමහරෙකු උදරයෙන් නිර්මාණය කළ බවත්, තවත් කොටසක් පයෙන් නිර්මාණයවී ඔවුන් අතිපහත් අය ලෙසත් මිනිස් උපත විපරීත කරන ආගම පිළිගැනීම.

ඒවා සියල්ල ඔබ විමර්ශනයෙන් තොරව අන්ධානු කාරව පිළිගැනීම කෙරෙහි අප ඔබට අවවාද කරමු.

යමෙකු කෑම්බීම්, ඇඳිම, විවාහවීම, නොවන්නට සාමාණ්‍යය සමාජ කටයුත්තන්හී වෙනත් සමාජයක් විසින් පරිහරනය වන අන්දමට ක්‍රියා කිරීම, ගතානු ගතිකව තම දෙමාපියන් අනුකරණය කිරීම පිළිගත හැකිය. නමුදු කෙනෙකු තම බුද්ධිය වර්ධනය වෙද්දී ඒවා චින්තයන් මගින් උරගා බලා ක්‍රියා නොකර සාධකයෙන් තොර අනුන්ගේ මතයන් පිළිගෙන විශ්වාස කරන්නේද, ක්‍රියා කරන්නේද, පවසයිද, එය සත්‍යාසත්‍ය ගැන පැහැදීමකින් තොරව හුදෙක් පිළිගැනීම කිසිවෙකු විසින් අනුමත නොකරයි.

එමතු නොව. මෙසේ හුදෙක් අන්ධානුකරනව ක්‍රියා කිරීමෙන් මෙලොව පමණක් නොව මතු ලොවෙහිද, විවෘත විමසුම, තීන්දුව, ස්වර්ගය සහ නිරය වැන්නෙහිද දුර්විපාකවලට භාජනය වීමට සිදුවනු ඇත. මතු ලොවෙහි දුර්විපාකයට පත්වූ කළ, දෙවියනි, මා මොහු උතුම් දැහැමියෙකුයැයි සිතා කුසාකුසල් නොතකා මාගේ දෙමාපියන්, මුතුන් මිත්තන් පෙන්වා දුන් ගතානුගතික මාර්ගය ඒ ආකාරයෙන්ම පිළිපැද්දෙමි. ඒවා වැරැදි යැයි දැන් මට අවබෝධ වී ඇත. එහෙයින් මට සමාවන්න යනුවෙන් පවසමා අයැදුවද අල්ලාහ් එය නොපිළිගනී.

ඔබ වටා ඇති මිසදිටු ව්‍යුහයන් අන්ධානුකරනව පිළිගැනීමෙන් වැළකී ඔබගේ චින්තන ගර්භය විවර කර මතු සඳහන් ප්‍රශ්වලට ප්‍රඥාගෝචරව පිළිතුරු සෙවිමට උත්සාහ කරන්න.

* දැනට මා පිළිගෙන වන්දනාමාන කරන ආගම සත්‍ය ආගමද නොවන්නට ව්‍යාජ එකක්ද?

* එය සත්‍යාගමක් නම් එයට චින්තනාත්මක සහ ඥානාත්මක සාධකයන් කුමක්ද?

* මා දැනට පිළිපදින ධර්මය මාගේ ජීවිතය තුල ශික්ෂාවක් ඇති කර මාව නිර්මාණය කිරීමට තුඩු දුන් හේතුව පරිසමාප්ත කිරීමට ඉවහල් වන දහමක්ද? එසේ නොවන්නට සතියකට වරක් පැය කීපයක්ද, දෛනිකව විනාඩි කීපයක්ද වන්දනාමාන කරන, නොවන්ට අන්ධානුකරනව

අනුන් පිළිපදින හෝ ගතානුගතිකව දෙමාපියන් සහ මුතුන්මිත් තන්ගේ වන්දනාමානයන් පිළිපදින ආගමක්ද?

* එසේ නොවන්නට සිතට වහල්වී මා කැමැති වන දේ පමණක් අන්තෝමතික ලෙස කර අකැමැති දේ නොකර කල් ගෙවීමට කිසිදු ප්‍රතිපත්තියකින් තොරව දහමකින් තොරව ක්‍රියාකිරීම හරිද?

* අප ජීවත්වන මෙම මිහිපිට දිවිමගේ යථාර්ථ හරය  කුමක් ද? මරණෙන් පසු අප යායුතු ස්ථානය කුමක්ද? මෙවැනි ප්‍රශ්නයන් රාශියක් හුදෙක් ඔබ සිතෙන්ම අසා කල් ගතවන්නට පෙර වහා සුදුසු පිළිතුරු ලබාගෙන පිරිසිදු චේථනාවෙන් පිටවීමට සූදානම් වීම ඔබ අනලස්ව කළ යුතු වැදගත්ම යුතුකමකි.

**සත්‍ය ආගම ඉස්ලාම් පමණී**

මුස්ලිම්වරු වන අප ඉස්ලාම් දහම සත්‍ය දහමක් ලෙස ප්‍රඥාගෝචරවද, චින්තනා මුඛයෙන්ද, පැහැසර සාධක මගින්ද, අල්කුර්ආනය සහ නබි තුමාගේ ආදර්ශමත් ඔවදන් මගින් ඔපවත්වූ දිවිමග මගින්ද, පිළිගෙන ඇත්තෙමු. මිහිපිට විවිධ කාලවල විවිධ සමාජයන් නියෝජනය කළ සියලු වක්තෘවරුන්ද ඒ කරුණ ප්‍රචාරය කරනු පිණිස හැර අන් කිසිදු කරුණක් උදෙසා පත් කළේ නැත. ඉස්ලාම් හැරෙන්නට අල්ලාහ් අන් කිසිදු ආගමක් කිසිවෙකුගෙන් පිළිගන්නේද නැත. එසේ පිළිගන්නන් කිසිවිටෙක සමා වන්නේද නැත.

ඒ ඉස්ලාම් ආගම පිළිගන්නා ලෙස අප ඔබ කිසිවිටෙක බලකිරීමටද සූදානම් නැත. ඉස්ලාම් ආගමේ කිසිදු බලකිරීමක් නැති බවද ඔබ දැන ගත යුතුය. වෙනුවට ඔබගේ අවධානය මේ කරුණ සම්බන්ධව යොමු කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු. කිසිදු ව්‍යාජ චින්තනයකින් තොරව අන් කෙනෙකු අනුගමනය නොකරද සන්සුන්ව ගතානුගතික සිරිත්විරිත් අන්ධානුකරණයෙන් පිළි නොපැද මෙම කරුණ කෙරෙහි ඔබගේ චින්තනය සහ අවධානය මදක් යොමු කරන්න. එසේ අවංකව සිත යොමු කරන්නේ කවරෙක්ද හෙතෙම මේ ඉස්ලාම් දහම සම්පූර්ණ සත්‍යයෙන් හෙබි දහමකැයි පිළිගනු සාක්ශාත්ය. කල්පාන්තය දක්වාම සියල්ලන් විසින් පිළිගෙන පිළිපැදිය හැකි සත්‍ය ඍජු ආගමද මේ ඉස්ලාම් දහම පමණක් බව ඔබ අවංකව පිළිගනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

**ඉස්ලාමීය ප්‍රතිපදාව කෙරෙහි මිනිසාගේ උවමනාව**

සැබැවින්ම ඉස්ලාම් දහම සත්‍ය දහමකි. එහි මිනිසා ගේ කිසිදු සිද්ධාන්තයක්ද හෝ තනි පුද්ගල මගපෙන් වීමක් හෝ නැත. එය සර්බ බල දෙවියා අල්ලාහ් විසින් පහළ කරන ලද දිව්‍යවදනින් හෙබි එකක් බවද, සමස්ත මානවයාම එහි රැඳී ඇති බවත් ඔබ සවිස්තරව වටහා ගන්නට නම් ඉස්ලාමීය ප්‍රතිපදාවන් සහ එහි නීතරීතීන් පිළිබඳ මදක් ඔබ සිත යොමුකිරීම මැනවැයි අපේක්ෂා කරමු.

- ඉස්ලාමීය ආගම මූලික ප්‍රතිපදාවෙන්ම අති සරලය. පැහැදිලිය. එහි අන් කිසිදු ආගමක්

හෝ නිකායයක් හෝ ඇතුලත්වී අව්‍යාජ වී නැත.

- තවද ඉස්ලාම් දහම මිනිසා තවත් මිනිසෙකුගේ පාමුල වැදී වැටී වන්දනා කිරීමෙන් වළකන්නේය. එහි පිළිම වන්දනාවකට හෝ රූපිත රූප වන්දනා වකට හෝ කිසිසේත් අනුමැතියක් නැත.
- තවද කීකරුවීම, අවනතවීම, යටත්වීම සහ බිය වීම වැනි සියලූ කාර්යයන් අල්ලාහ්ට පමණක් සීමා කළ යුතුය.
- තවද සර්ව බල දෙවියා වන අල්ලාහ් ගැනවූ පැහැදීමද ලෞකික සහ එලෙව ජීවිතය ගැනවූ පැහැදීමද එවා එකිනෙක අතරවූ සාමූහික එක ගතාවය ගැනවූ විස්තරද එහි අන්තර්ගතවී ඇත.
- තවද මිනිස් ජීවිතයේ හරය සහ ඉලක්කය පැහැදිලි කරන අතර සෞභාග්‍යමත් ජීවිතයක් වෙනුවෙන්වූ මගපෙන්වීමද එහි අඩංගුය.
- තවද මිනිසුන් අතර ඉස්ලාමීය රමානීය හැඟීම් පුබුදු කර දෙස, බස, සේසත් වැන්නෙහි විපර්යාසයක් නොපෙන්වා සියලූ දෙනා එක් මිනිස් සමාජයක් යටතට ඒකායනය කරයි.
- මිනිසාට අර්ථවත් ආරක්ෂාවක් සහ සාමයක් උදා කර මිනිස් සමාජයට සෘජු නිහතමානී දිවිමගක් ලබා දෙන්නේය. මන්ද යත් සියල්ල යටත්විය යුත්තේ අල්ලාහ්ට පමණි. කීකරු විය යුත්තේ,

බිය විය යුත්තේ ඔහුට පමණී. සියල්ල ක්‍රියා වන්නේ ඔහුගේ මහගු අනසක යටතේය. මෙවන් කරුණු රාශියක කෙනෙකුගේ සිත් තුල අවබෝධ වන කළ හෙතෙම අන් කිසිවෙකු හට බියවීමට උවමනා නැති බව තිරසාරව අධිෂ්ඨාන කර ගන්නේය.

- මිහිපිටවූ ආගම් අතරින් සර්ව බල දෙවියන් වන අල්ලාහ් පමණක් වන්දනාමාන කළ යුතු බව තිරසාරව තහවුරු කරන්නේ ඉස්ලාම් ආගම පමණී. ඒ තුලින් ඔහුගේ අනේක විධ විනය පද්ධතියන්, ක්‍රියාකලාපයන් සහ අනෙකුත් සියලු කටයුත්තන් සම්මිශ්‍රණය වන්නේය. එහෙයින් පරිසමාප්ත අර්ථයෙන්ම සුකර්මයන් කරන්නේද, විනයානුකූලව හැසිරෙන්නේද තමා බවද, අනුන්ට වඩා උසස් යැයිද උඩගු ලෙසද කටමැත දොඩවීමට කිසිවෙකුට නොහැකිය. සියලු අභිමානයන් අයත් වන්නේ සර්ව බල දෙවියා වන අල්ලාහ්ට පමණී.
- තවද මිනිසා කරදරයකට පත්වන කළ අල්ලාහ් විසින්ම ඇතිවූ ඒ කරදර දුක් දොම්නස අල්ලාහ් වෙනුවෙන්ම ඉවසා පිළිගන්නා අතර අල්ලාහ්ගේ දයාව සහ කරුණාව කෙරෙහි කලකිරීමට පත් නොවී ඉවසීමෙන් සහ සන්සුන්ව කටයුතු කිරීමෙන් කරදරවලින් මිදීමට මංපාදන්නේය. එමතු නොව. මිනිසාට ඇතිවන දහසකුත් එකක් කරදරවලින් ඇතිවිය හැකි අලාභහානි සහ අනෙකුත් විපරීතයන් සිත් සතුටෙන්

පිළිගැනීම කෙරෙහිද මිනිසා ශික්ෂණය කරන්නේය.

**පරලොව ජීවිතය විශ්වාස කිරීම**

තවද යමෙකු සර්ව බල දෙවියා වන අල්ලාහ් කෙරෙහි විශ්වාස කරන අතරම මරණින් මතු ජීවිතය කෙරෙහිද විශ්වාස කළ යුතුය. එනම් මිනිසා මැරී භූමදානයෙන් පසු එළඹෙන පරමාන්ත දිනයේ ආපසු පනපොවා නැගිටවා සසර වසන කළ ලොකු, කුඩා, කුසල් අකුසල් කර්මයන් සියල්ල ගැන විවෘතව විමසා අල්ලාහ් සහ අල්ලාහ්ගේ වක්තෘවරයා පිළිගෙන කුසල් ක්‍රියාවන් කළ අය හට ස්වර්ගයද, තම සිතට වහල්වෙමින් නොසැළකිල්ලෙන් සසර විසූ අය හට ගොරතර නරකාදියේ අඬුවමද ලැබෙන බව විශ්වාස කිරීම වේ.

ඉස්ලාම් ලුහුඬුව මතුලොව ගැන විස්තර කරන්නේ මෙසේය. නමුදු මතුලොව, ස්වර්ගය සහ නරකාදිය වැනි දේ ගැන නෙයෙකුත් ආගම් සහ සිද්ධාන්තයන් පවසන්නේ කුමක්ද? ඒ න්‍යායන්, පද්ධතීන් සහ ප්‍රතිපදාවන් බුද්ධිගෝචරව පිළිගත හැකිද යන්න මදක් සිතා බැලීම වැදගත්ය.

ඔවුන්ගේ සමහර මතඃ

- ඔවුන්ගෙන් සමහරෙකු, මරණය හා මිනිසාගේ සියලු කටයුතු අවසන් වෙයි, ඔවුන් එවිට නිරයක හෝ සවර්ගයක හෝ ගොරතර අඬුවමක් හෝ ප්‍රතිවිපාකයක් ලෙස නොලබන බවත්, ආගම්වල ඇති මතුලොව ගැනවූ අදහස්

එහි ලබ්ධිකයන් තම ආගමෙන් දුරස්ථවී යාමෙන් වළක්වා ගැනීමට යොදා ගත් මනෝමතාන්ත බවත් පවසති.

- තවත් සමහරෙක්, මැරුණු කෙනෙකුගේ දේහය නොබෝ කලකින් විනාශ වී යනු ඇති බවත් එහෙයින් පරමාන්ත දිනයේ නැගිටවනු ලබන්නේ දේහයෙන් තොරවූ ප්‍රනායන් පමණක් බවත් පවසති.
- සත්ක්‍රියාවන් සහ එවා ක්‍රියාවීම ස්වර්ගය යනුවෙන්ද නරකාදිය යනු දුර්ක්‍රියාවන් සහ ඒවාට අධාලව ක්‍රියාවීම යනුවෙන්ද තවත් සමහරු පවසති.
- සවර්ගයන් පැවතීම සත්‍ය බවත් එහි ඇතුල්වන්නේ ඒ ඒ ආගම්වල නායකයන් සහ එහි ලබ්ධිකයන් පමණක් බවත් තවත් සමහරු අදහස් කරති. කෙසේද යත් තමන් ගතානුගතිකව පිළිපදිනා දෙවිවරු මිනිසුන්, පිළිමයන්, ගස් සහ ගල් වැනි ඒවා වුවද ඒවාට බැතිසිතෙන් ගරුබුහුමන් කිරීමෙන් ස්වර්ගයට පිවිසිය හැකි බවය.
- අප අනිවාර්යේ පරිශ්‍රමයෙන් නැමදුම්, උපවාසශීලය සහ හජ් වැනි ක්‍රියාවන් මගින් අල්ලාහ්ට වන්දනා මාන කරන්නේ මන්ද? අප සතුව විශාල සේසතක් ඇත. ඒ සේසත් මගින් අල්ලාහ් වෙතින් පව් සමාව සහ දයාව ලබා ස්වර්ගයේ උසස් ස්ථානයක් ලබාගත හැකි බවත් පවසති.

මතුලොව ගැන බොහෝ දෙනෙකු පවසන්නේ මෙ වැනි අදහස් ගොන්නකි. මේවා ප්‍රඥාගෝචරය පිළිගත හැකිදැයි සිතා බැලීම මනාය. ඒකායන සත්‍ය ආගමක් මේ අදහස පිළිගනීද? මෙවැනි කාල්පනික අදහස් යථාර්ථයට සහ සත්‍ය ආගමේ ප්‍රතිපත්තිවලට පටහැනි හෙයින් ඇත්තෙන්ම කිසිදු නැණවතෙකු මෙවැනි අදහස් පිළිගන්නේ නැත.

මන්දයත්, මිනිසා සත්‍ය දෙවියන් වන අල්ලාහ්ගේ ආඥාවන් හට කීකරුවී ඔහු පමණක් වන්දනාමාන කරන කෙනෙකු විය හැකිය. නොවන්නට අල්ලාහ්ගේ ආඥාවන් හට පිටුපා අත්තොමතික ලෙස ක්‍රියා කරන ඉස්ලාම් ආගමෙන් දුරස්ථ කාෆිර්වරයෙකු විය හැකිය. නොවන්නට අයුක්තියට හවුල් කරුවෙකු ලෙස හෝ අසාධාරණයට භාජනය වූ හෝ කෙනෙකු විය හැකිය.නොඑසේ නම් මසුරු ධනවතෙකු ලෙස හෝ අන්ත දුප්පතෙකු හෝ විය හැකිය. මිහිකත වසන මිනිසාගේ තරාතිරම් මෙසේ විවධාකාරව පවතිද්දී මතුලොවේදී ප්‍රඥාවන්ත විනිශ්චය කරුවා වන අල්ලාහ් සියල්ලන් හට එක් සමාන ඵලවිපාක ලබාදීම ශ්‍රැධාවන්ත මුස්ලිම්වරයෙකුට කෙරෙන අන්ත අසාධාරණ නොවන්නේද?

අයුක්තියෙන් විභාගය පෙනී සිටී අයද විය හැකිය. ඍජුව නිහතමානීව විභාගයට මුහුණු දුන් අයද විය හැකිය. මෙසේ විභාගලාභීන් විවිධාකාර වෙද්දී සියලු දෙනාගේ ප්‍රතිඵල එක් සමානව පවතීම කිසිවෙකු පිළිගැනීමට සූදානම් නැත. සාමාණ්‍යය ලෞකික

කටයුත්තක්ම මෙසේ පවතිද්දී මතුලොව විපාක සියල්ල එක් සමාන වීම නීතිගරුක වන්නේ කෙසේද?

**ඉස්ලාම් සහ මුස්ලිම්වරු**

අව්‍යාජ සත්‍ය මුස්ලිම්වරයෙකු නොපිළිගන්නා, සමහර මුස්ලිම්වරු විසින් කරනු ලබන ඉස්ලාම් ආගම තරයේ හෙලා දකින අපරාධ, මුසාවාද, හොරමැරකම්, දුරාචාර, අයුතු ඝාතන වැනි අසත්පුරුෂ ක්‍රියාවන් බහුලවූ නිසා ඉස්ලාම් ආගම පිළිගැනීම කෙරෙහි ඔබ මදක් පසුබට විය හැකිය. නමුදු ඔබ ඉස්ලාමය සහ ඉස්ලාමය තුල සිටින අය ගැන වෙන්වෙන්ව නිරීක්ෂණය කර බැලිය යුතුව ඇත. මුස්ලිම්වරු කරන සියලු ක්‍රියාවන් ඉස්ලාම් අනුමත කළ ඒවායැයි නොසිතන්න. මන්දයත් ඉස්ලාමයේ ප්‍රතිපත්තිවලට සහ හුදෙක් ඉස්ලාමය පිළිපදින්නන් අතර විශාල වෙනසක් වේ. ඉස්ලාම් යනු අල්ලාහ් දෙවියන් විසින් මානවයා වෙත පිරිනමන ලද පරිසමාප්ත පරිශුද්ධ අද්විතීය ජීවන මගකි. අති සම්භාවණීය ආගමකි. බොහෝ දෙනෙකු තමන් සැබෑ මුස්ලිම්වරු යැයි පවසමින් ඉස්ලාම්වලට පටහැනිව අන්තොමතිකවද විවිධාකාරව ක්‍රියා කරති.

සත්‍ය ඉස්ලාමීය ඉගැන්වීම් හිතෛෂිව පිළිගෙන ඒ අනුව තම දිවිමගෙහි ඒවා සම්පූර්ණයෙන්ම ක්‍රියා කරන්නේ කවරෙක්ද නියම මුස්ලිම්වරයෙකු වන්නේ ඔහු පමණි. වෙනුවට ඉස්ලාමීය ප්‍රතිපදාවන් හුදෙක් වදනින් පමණක් පිළිගෙන සිතට වහල්වී අන්තොමතික ලෙස ක්‍රියා කරන කළ ඔවුන්ගේ

ක්‍රියාවන් අනුව ඉස්ලාමය තුල ඔවුන්ගේ තරාතිරම ස්ථිර වනු ඇත.

එමනිසා මේ සත්‍ය ඉස්ලාම් ආගම අල්ලාහ් දෙවියන් විසින් හෙළිදරව් කරණ ලද ඒ යථාර්ථ අන්දමින්ම නියමාකාරව වටහා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම් එහි ප්‍රධාන ප්‍රභවය වන අල්කුර්ආනය, එහි අර්ථ විවරණ ග්‍රන්ථවලින්ද, මුහම්මද් නබි තුමාගේ ආදර්ශ මගපෙන්වීම මගින්ද, තවද ඉස්ලාම් ආගම ආත්ම ධෛර්යය ක්‍රියා කෞශල්‍ය සහ පරිත්‍යාග ශක්තිය තුලින් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම උධාර ලෙස තම දිවිමගෙහි යෙදූ අසහාය මුස්ලිම්වරුන්ගේ ඍජු මගපෙන්වීම් වලින්ද, ඉස්ලාම් ආගමේ ප්‍රභවයන් දෙක වන අල්කුර්ආනය සහ නබි තුමාගේ සුන්නාහ් සංකල්පයට පටහැනි නොවූ ඉස්ලාමීය පොත්පතින්ද විශදව ඔබට දැන ගත හැකිය.

එසේ ඔබ ඉස්ලාම් දහම ගැන අව්‍යාජ ලෙස සොයා බලා හෘදයාංගව පැහැදෙන්නේ නම් ඔබ සත්‍ය ඉස්ලාම් ආගම පිළිගෙන අල්ලාහ්ට කීකරුවූ අතවැසියෙක්ය.

ඉස්ලාම් ආගම බාහිර බලපෑමකින් තොරව සිත් සතුටෙන් පිළිගැනීමට සූදානම් වෙද්දී ඇතිවිය හැකි ගැටලු එයට බාධකයැයි තීරණය කිරීමෙන් වළකින ලෙසද කරුණාවෙන් ඉල්ලා සිටිමු.

අප පෙර සඳහන් කළ දේ සහ ඉස්ලාම් ආගම ගැන අවංකව අධ්‍යයනය කර අවබෝධයක් ලබා ඒ ආගම පිළිගැනීමට සැරසෙන කළ, සමහරවිට ඔබ

දෙමාපියන් ළමයින් සහ නැහිකම්තුරන් ඔබ සමග උරණ විය හැකිය. සමහරවිට ඔබගේ රැකියාවන් සහ ජීවනෝ පායන් හට බාධක විය හැකිය. ඔබගේ හිතමිතුරන් ඔබ වෙතින් ඈත් විය හැකිය. ඔබ වෙසෙන පරිසරය සහ සමාජය ඔබ පිළිකුල් කර කොන්කිරීමට හැකිය. නොවන්නට අනෙකුත් සමහර පරිභාහිර ප්‍රශ්ණවලට මුහුණ දීමටද සිදුවීමට හැකිය. සමහරවිට එවන් බාධක ඔබ සිත චංචලයට, චලනයට පත්කිරීමටද, අල්ලාහ් දෙවියන් විසින් අවංක මුස්ලිම්වරු වෙනුවෙන් පිළියෙල කර ඇති සත්‍ය ගැලවීමේ මාර්ගය සහ එහි ප්‍රතිවිපාක යන් තෝරාගැනීමට සුවිශාල බාධාවන්ද විය හැකිය.

නමුදු ඔබ ඒවා සත්‍ය සෘජුමග තොරාගැනීමේදී බාධාවන් ලෙස නොසිතන්න. වෙනුවට ඒ බාධකයන් හට එඩිතරව මුහුණ දී ඒවා ජය ගෙන අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා ඔහුගේ සුරක්‍ෂාව සහ පිටිවහල බලාපොරාත්තුවෙමින් තිරසාර ආත්ම දමනයකට පත්වීම ඔබ යුතුකමකි.

ඔබ දිවිමග යහමගකට යොමුවන්නේ ඔබ එසේ තිරසාරව තීරණයකට එළඹීමෙන් පමණී. මිනිසා පිළිපැදිය යුත්තේ තිරසාර සත්‍ය මගකි. පිළිපැදීමට සත්‍ය හැර අන් දෙයක් මිහිපිට නැත. සසරෙහි මහගු දෙය වන්නේද එයය. මතුලොව තමාගේ ඇවැස්ස ඥාතියෙකු වුවද අකුසල් කර්මයන් නිසා ඵලවිපාකයට පත්වනු නොඅනුමානයි.

හිතෛෂීව ඉස්ලාම් දහම ගැන පැහැදී එය පිළි ගන්නේ කවරෙක්ද ඔවුන් හට අප පවසන්නේ ඉස්ලාම් ආගම සෘජු පහසු ආගමක් බවය. එහි ප්‍රතිපත්තීන් අති උසස් වන අතර සෑම හිතටම සමීපස්ථය. එය විදහාපාන ඒකදේව වාදය අති පිරිසිදුය. එහි වන්දනාමාන සරල සහ පහසු ඒවාය. එය පවසන විනය පද්ධතියන්ද අති උධාරය.

ඉස්ලාම් පවසන වන්දනාමාන අතරින් ප්‍රධාන තැනක් උසුලන්නේ සර්වබල දෙවියා අල්ලාහ් සහ අල්ලාහ්ගේ කීකරු අතවැසියා වන වක්තෘ මුහම්මද් තුමා පිළිගැ නීම වේ. අනතුරුව දෛනික සලාත් හෙවත් පස්වතා දේවනැමදුම අඛණ්ඩව ඉටුකිරීම වේ. තවද, තම සේසතෙන් වාර්ෂිකව ඉස්ලාම් පවසන අටකොටසකට සකාත් හෙවත් දුගී බද්ද ගෙවන අතර රමළාන් මාසයේ සව්ම් නම් උපවාස ශීලයෙහි යෙදීමද වේ. එහි අවසාන කටයුත්ත වන්නේ අවශ්‍ය මිලමුදල්, ශක්තිය සහ අවස්ථාව ලබන්නා මක්කාවට ගොස් වක්තෘ මුහම්මද් තුමාගේ ආදර්ශානුකූලව හජ් කර්තව්‍යය ඉටුකිරීම වේ. එසේම ඉස්ලාම් පවසන අනෙකුත් කටයුතුද ඒ ආකාරයේන්ම නොපිරිහෙළා ඉටුකිරීමට සෑම මුස්ලිම් වරයෙකුම බැඳී සිටී.

සාධකයෙන් තොර අනුකාරකවාදීන්ගේ
වන්දනාමාන සර්වබල අල්ලාහ් කිසි විටෙක
පිළිගන්නේ නැත.

තවද සමහරු උඩගු ලෙස පවසන අයුරු අපගේ වන්දනාමානයන්ගෙන් අල්ලාහ්ට කිසිදු උවමනාවක් නැති බව තරයේ වටහා ගත යුතුය. එසේම මිනිසා කරන අකුසල් කර්මයන් නිසාද සර්ව බල අල්ලාහ්ට කිසිදු නපුරක් සිදුවීමට නොහැකිය. නමුදු සර්ව බල අල්ලාහ්ට අවංකව කීකරුවීමෙන් සසර ජීවිතය ශික්ෂාවී සෘජු වන අතර සිත් සතුට, සෞඛ්‍ය, සෞභාග්‍යය, පෝෂණ වර්ධනය, ධෛර්යය, දීර්ගායුෂ, සැපසම්පත් වර්ධනය, නිහතමානී කුඩුම්බ දිවියක්, සන්තාන විස්ථාරය, අකුසල් කිරීමෙන් වැළක්වීම සහ අනෙකුත් විවධ වර්ධනයන් කීපයක්ද වේ.

එසේම මරණෙන් මතු එලොව ජීවිතයේ නිරයෙන් ගැලවීමද, සුවර්ගය ලැබීමේ අතිමහත් භාග්‍යද ලබන්නේය. අවංකව සර්ව බල අල්ලාහ්ට කීකරුවී ජීවත් වන්නන් හට ස්වර්ගයේ කුමක් පිළියෙළ කර ඇත්දැයි ඔබ දන්නවාද? සකෙවින් පවසනාවම් කිසිදු නෙතක් නොදුටු කිසිදු සවණක් නොඇසූ අද්විතීය ප්‍රමුධිත දෑ එහි සූදානම් කර ඇත. එසේම අල්ලාහ්ගේ ආඥාවන් හට අකීකරුවී සිත්සේ දිවි ගෙවන්නන් හට දඬුවම් පිණිස මිහිපිට ගිනිජාලයට වඩා රෞ ගින්නක් නිරයේ සූදානම් කර තබා ඇත. අල්ලාහ් ඒ රෞ ගිනිජාලාවෙන් අප සියල්ල රැක දෙත්වා.

මෙතෙක් කල් ඔබ ගෙවූ දිවමග ඔබට ගෙන දුන්නේ සෙතක්ද නොවන්නට දුකක්ද යන්න වටහා ගෙන සෘජුමගට යොමුවීමට ස්වර්ගය සහ නිරය

ගැන අප පැහැදිලි කළ සංෂිප්ත විස්තර පමණක් ප්‍රමාණවත් වනු ඇතැයි සිතමු. ඔබ ඒ කරුණු මැනවින් වටහා ගෙන යහමග ගැන පැහැදෙනු ඇතැයි අපේක්ෂා කරමු.

අවසානය පෙර, ඔබ සසර අවුරුදු අසූවක-සියයක් ජීවත්වූවද, නොවත්තනට එයට වඩා අධික හෝ කෙටි කලක් හෝ ජීවත්වූවද, කවදා හෝ දිනයක ඔබ මෙලොවෙන් තුරන්වී ඔබ දෙවියා ඉදිරියට පමුණුවනු පසක්ය. මරණය සෑම මොහොතකම මිනිසා ලුහුබඳිමින් පසු වෙයි. කිසිවෙකුට එයින් වැළකිය නොහැකිය. කල්පාන්තයේ එළඹෙන විචාන විමසීම් දිනයේ ඔබ සසර කළ යහපත්-අයහපත් ක්‍රියාවන් ගැන විමසනු ලබනු නොවැළැක්විය හැකි සිදුවීමක් බවද වටහා ගැනීම ඔබ යුතුකමකි.

කරුණ මෙසේ තිබියදී, ඔබගේ මරණෙන් පසු විය හැකි විචාන විභාගය, එහි පලවිපාකය, ස්වර්ගය සහ නරකාදිය වැන්නන් ප්‍රතිකෙෂ්ප කර මරණෙන් මතු වන නිත්‍ය ජීවිතය වන ස්වර්ග සෞභාග්‍ය වෙනුවට විනාශ විය හැකි කෙටි සසර ජීවිතයේ සුලු කම්සැප පමණක් භුක්ති විඳ ආයුවළදීම කිසිවෙකු පිළිගැනීමට සූදානම් නැත යන්න නොරහසකි. ඔබද එවැනි ජීවිතයක් කෙරෙහි ප්‍රියවන්නේ නම් එය ඔබගේ අල්ප ඥානය සහ නියාලු කම හැර අනෙකක් නොව.

එහෙයින් හිතවත, ඔබ වෙනුවෙන් වූ විචාන අවස්ථාවන් තවමත් ඇහිරී නැත. ඔබ ජීවිතයේ

ඉතිරි කාලයේදී හෝ ව්‍යාජ දහමෙන් ඉවත්වී නිත්‍ය දෙවියන් වන අල්ලාහ් විසින් පෙන්වන ලද සත්‍ය සත්මාර්ග දහම වන ඉස්ලාම් දහම පිළිගෙන ඒ අනුව ජීවත්වීමට අප කරන ඇරයුමයි මෙය. ඔබ අප ඇරයුම හිතානත්තව පිළිගනු ඇතැයි අපේක්ෂාවෙන් සිටිමු.

අවසාන වශයෙන්,

ඔබගේ විවෘතව ඉස්ලාමය සහ එහි විශ්වාසය තහවුරු කර පිළිගෙන අප පෙර සඳහන් කළ දේ ඔබ චින්තනයට නව ආරයක් ගෙන දී මේ අද්විතීය ඉස්ලාම් දහම පිළිගෙන යහමග පත්වීමට සර්ව බල අල්ලාහ්ගෙන් යටහත්ව ඉල්ලා සිටිමු. ඔබ හැකි ඉක්මණින් ඉස්ලාම් දහම පිළිගැනීමට අපේක්ෂා වන ඒ වාසනාවන්ත දිනය සිත් සතුටින් බලාපොරොත්තු වෙමු. එහෙයින් හැකි විගස දැහැමි ඉස්ලාමීය සහෝදරයෙකුරංසහෝදරියෙකු විලසින් අප හා එක්වනු ලෙස සිත් සන්තෘෂ්ටියෙන් ඇරයුම් කරමින් ඔබගෙන් සමු ගන්නනෙමු.

ඒ අද්විතීය ඉස්ලාම් දහම ගැන මනා දැනුමක් ලබාගැනීම පිණිස අපගේ මතු සඳහන් ලිපිනයෙන් විමසන ලෙසද ඉල්ලා සිටිමු.

# ඔබට හසුනක්

ඔබට හසුනක්

# ඔබට හසුනක්